# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1743/28 - 2012 පෙබරවාරි 03 වැනි සිකුරාදා - 2012.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

2010 අංක 8 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත

10 වැනි වගන්තිය යටතේ නියමය

ඉහත සංශෝධන පනතෙහි විධිවිධානයන්ට අනුව 2010 අගෝස්තු මස 17 වැනි දිනට පෙර අදාළ සිද්ධීන් සම්බන්ධයෙන් හිමිකම් පෑමේ දිනය 2012.12.31 වැනි දින වශයෙන් මින් නියම කරමි.

මෙම නියමයන් 1970 අංක 18 දරන වැන්දඹු අනත්දරු (සන්නද්ධ හමුදා) පනත හා එහි සංශෝධන සම්බන්ධයෙන් ද බල පැවැත්වේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2012 ජනවාරි මස 31 වැනි දින,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

02-598/1

---

2010 අංක 9 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත

9 වැනි වගන්තිය යටතේ නියමය

ඉහත සංශෝධන පනතෙහි විධිවිධානයන්ට අනුව 2010 අගෝස්තු මස 17 වැනි දිනට පෙර අදාළ සිද්ධීන් සම්බන්ධයෙන් හිමිකම් පෑමේ දිනය 2012.12.31 වැනි දින වශයෙන් මින් නියම කරමි.

මෙම නියමයන් 1998 අංක 60 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු (සන්නද්ධ හමුදා) පනත හා එහි සංශෝධන සම්බන්ධයෙන් ද බල පැවැත්වේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2012 ජනවාරි මස 31 වැනි දින,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

02-598/2

1A - G 15633 — 1345 (2012/02)

1970 අංක 18 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (සන්නද්ධ හමුදා) පනත

3 වැනි වගන්තිය යටතේ නියමය

1970 අංක 18 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (සන්නද්ධ හමුදා) පනත සහ 2009 අංක 29 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (සන්නද්ධ හමුදා) සංශෝධන පනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම, සන්නද්ධ හමුදාවල ස්වේච්ඡා සාමාජිකයකු විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකයකු වීම සම්බන්ධව පහත සඳහන් නියමයන් නියම කරමි.

අංක 1607/8 - 2009 ජූනි මස 23 වැනි අඟහරුවාදා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළ කරන ලද 3 වැනි වගන්තිය යටතේ නියමයෙහි අංක 3 පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

1. 1981.09.01 දිනට පෙර පත්වීම් ලබා එදිනට සේවයේ යෙදී සිටි යම් සාමාජිකයෙක් වෙතොත් ඔහුටද, කලත්‍රයාටද, අනත්දරුවන් හෝ අනත්දරු භාරකරුටද මනාපය පළකල හැකි අතර එකී මනාපය පළ කල හැකි අවසාන දිනය 2012.12.31 වේ.

එහි සඳහන් අනිකුත් නියමයන් පෙර පරිදිම ක්‍රියාත්මක වේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2012 ජනවාරි මස 31 වැනි දින,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

02-598/3

---

1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත

3(6) (අ) සහ (ආ) වැනි වගන්තිය යටතේ නියමය

2001 අංක 02 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනතින් සංශෝධිත 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 3 (6) (අ) සහ (ආ) වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අවසන් වශයෙන් තවත් එක් වරක් පමණක් මනාපය ප්‍රකාශ කිරීමේ කාලය දීර්ඝ කිරීමට රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම, මේ නියමයෙන්,

1. 1983.08.01 දිනට රාජ්‍ය සේවයේ සේවා නියුක්ත වූ නිලධාරිනියක් විසින් විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා මනාපය ප්‍රකාශ කිරීමට තීරණය කරනු ලැබිය හැක්කේ යම් දිනයකට පෙරද, එම දිනය 2012.12.31 ලෙසද,

2. නිලධාරිනිය විශ්‍රාම ලබා ඇත්නම් අයවිය යුතු හිඟ දායක මුදල් හා පොළිය එකවර ගෙවිය යුතු බවද, එය විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2008 අනුකූල විය යුතු බවටද,

3. තවද නිලධාරිනිය මියගොස් ඇත්නම් අදාළ දායක මුදල හා පොළිය ප්‍රදානයෙන් එකවර අඩු කල යුතු බවත් නිලධාරිනිය සේවයේ යෙදී සිටින්නේ නම් ඇය විශ්‍රාම යාමට පෙර මුළු දායක මුදල හා පොළිය අයකල යුතු බවත් නියම කරමි. තවද මෙම නියමය ශ්‍රී ලාංකීය පුරවැසිභාවය ඇති තැනැත්තියන්ට පමණක් සීමා වන බවද තවදුරටත් නියම කරමි.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2012 ජනවාරි මස 31 වැනි දින,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

02-598/4

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය

1934 පෙබරවාරි 05 වැනි දින නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය සහ 1972 මැයි 05 වැනි දින දරන සංශෝධිත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 51 වගන්තිය යටතේ නිවේදනය.

නිවේදනය

කලින් කල සංශෝධිත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 02 වගන්තියට ඉනික්බිතිව පහත දැක්වෙන පරිදි අතුරු වගන්ති ඇතුලත් කිරීමෙන් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ.

1953 අංක 44 දරන පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් පනත සහ 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත යටතෙහි විශ්‍රාම වැටුප් හිමිකම් ලබන ගුරුවරු/ගුරුවරියන්ට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබෙන විට, එකී විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ බලපැවැත්වෙන විධිවිධාන ඒ ආකාරයට ඔවුන්ට ද බලපවත්වන්නේය. කෙසේ වෙතත් ඔවුන් තම විශ්‍රාම වැටුප් හිමිකම ආරක්ෂාකර ගැනීමට සේවා කාලය තුළදී ගුරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු අතර, එම දායක මුදල ලැබෙන මූලික වැටුපෙන් 6%ක් විය යුතුය.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2012 ජනවාරි මස 31 වැනි දින,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

02-598/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.